ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රයේදී ජනවාරි 04, 2024 දින පැවැත්වුණු මාධ්‍ය හමුවකදී ආයුර්වේද රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි අදහස් දක්වමින් පවසා ඇත්තේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති ස්පා මධ්‍යස්ථාන 6000ක් පමණ රට පුරා තිබෙනා බවයි. එසේම තරුණ තරුණියන් 50,000 ක් පමණ මේවායේ සේවයේ නිරතව සිටින බවයි.

මෙම පුවත අරුණ පුවත් වාර්තාවක් ඔස්සේ ඉදිරිපත් වන්නේ මෙලෙසිනි.

සිරස්තලය - "තරුණ තරුණියෝ 50,000ක් ඇඟ මිරිකයි"

අනවසරයෙන් පවත්වාගෙන යන සම්භාහන ආයතන සම්බන්ධයෙන් නියාමනයක් අවශ්‍ය බව හැඟවීම හෝ, ඒ සම්බන්ධ සංඛ්‍යාලේඛන දත්ත ඉදිරිපත් කිරීම පිළිගත හැකි කරුණකි.

එසේ වුවත්, එම වෘත්තිය හෝ එම වෘත්තියේ යෙදී සිටින්නවුන් ගර්හාවට හෝ කොන් කිරීමට ලක් කෙරෙනා සමාජ ආකල්පයක් තීව්‍ර කිරීමට මාධ්‍ය දායක විය යුතුද යන්න පැනයකි.

ඒ අනුව, මෙම සිරස්තලය සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

